# පාලි
# (Pali)
# (PALI)

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

# විෂය නිර්දේශය

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

**www.cdce.kln.ac.lk**

**<u>නව විෂය නිර්දේශය</u>**

ප්‍රථම මුද්‍රණය - 2022

මෙම විෂය නිර්දේශයන්හි අන්තර්ගත කරුණු අදාළ අධ්‍යයන අංශයන්ට හිමි වන අතර මෙහි ප්‍රකාශන අයිතිය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සතු වේ.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් ලිඛිත අවසරයකින් තොරව මෙහි සඳහන් කරුණු උපුටා දැක්වීම මුද්‍රණය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රකාශනය :**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*
*කැලණිය විශ්වවිද්‍යාලය*
*කැලණිය*

# පාලි

| ස්තරය | සමාසිකය | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | අනිවාර්ය/ වෛකල්පික | අධ්‍යයන සම්භාර |
|---|---|---|---|---|---|
| 01 | I සහ II | PALI 18214 | සූත්‍රපිටක අධ්‍යයනය | අනිවාර්ය | 4 |
| | | PALI 18224 | පාලි ව්‍යාකරණය හා ව්‍යාවහාරික පාලි | අනිවාර්ය | 4 |
| 02 | III සහ IV | PALI 28214 | පාලි සාහිත්‍ය ඉතිහාසය හා සාහිත්‍ය විචාරය | අනිවාර්ය | 4 |
| | | PALI 28224 | පාලි අධ්‍යයනය සඳහා ඉංග්‍රීසි හා පරිවර්තනය | අනිවාර්ය | 4 |
| 03 | V සහ VI | PALI 38214 | ථෙරවාද විනය හා අභිධර්ම අධ්‍යයනය | අනිවාර්ය | 4 |
| | | PALI 38224 | විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය හා රචනය | අනිවාර්ය | 4 |

# ප්‍රථම වසර

# PALI 18214
# PALI 18224

**පාඨමාලා කේතය** :- **PALI 18214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- සූත්‍රපිටක අධ්‍යයනය

**ඉගෙනුම් පල** :-

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමේ දී විද්‍යාර්ථියා හට,

- පාලි ත්‍රිපිටකයේ ඓතිහාසික පසුබිම හැඳින්වීමට
- පාලි සූත්‍ර කියවීමට හා තේරුම් ගැනීමට
- සම්භාව්‍ය ග්‍රන්ථවලට අදාළ ව පරිවර්තන ක්‍රමවේද පිළිබඳ පැහැදිලි කිරීමට
- තෝරාගත් උද්ධෘත සිංහල/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමට
- නිර්දිෂ්ට ග්‍රන්ථවල අන්තර්ගතය විශ්ලේෂණය කිරීමට
- ඒවායේ දැක්වෙන බුදුරජාණන් වහන්සේගේ මූලික ඉගැන්වීම් හඳුනාගැනීමට

**පාඨමාලා අන්තර්ගතය** :-

01. අම්බට්ඨසුත්ත (දී.නි.)
02. දෙවදහවග්ග (ම.නි.)
03. භික්ඛුනීසංයුත්ත (සං.නි.)
04. සත්තකනිපාතයේ මහායඤ්ඤවග්ගය (අං.නි.)
05. සුත්තනිපාතයේ උරගවග්ගය (ඛු.නි.)

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. Jayathilaka, K. N. (1975): **The Message of the Buddha,** London.
2. **අංගුත්තරනිකාය** 4 (2006). බුද්ධජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
3. **සුත්තනිපාත** (2006). බුද්ධජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
4. **දීඝනිකාය 1,** (2006). බුද්ධජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
5. ධම්මානන්ද හිමි, තලල්ලේ (1983). **ත්‍රිපිටකයේ සංස්කෘතික ලක්‍ෂණ,** බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල.
6. **මජ්ඣිමනිකාය** 3 (2006). බුද්ධජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
7. **සංයුත්තනිකාය** 1 (2006). බුද්ධජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

**පාඨමාලා කේතය** :- **PALI 18224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- පාලි ව්‍යාකරණය සහ ව්‍යාවහාරික පාලි

**ඉගෙනුම් ඵල** :-

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමේ දී විද්‍යාර්ථියා හට,

- පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් හැඳින්වීමට සහ ඒවායේ වෙනස්කම් සාකච්ඡා කිරීමට
- පාලි ව්‍යාකරණයේ ප්‍රභේද නිදසුන් මගින් පැහැදිලි කිරීමට
- සම්භාව්‍ය කෘතිවල ඇති පාලි ඡේද ව්‍යාකරණානුකූල ව විග්‍රහ කිරීමට
- දිනපතා භාවිත කරනු ලබන පාලි පාඨයන්හි නිවැරදි අරුත් තහවුරු කිරීමට
- ව්‍යාකරණය පිළිබඳ නිවැරදි අවබෝධයකින් යුතුව එබඳු මූලාශ්‍රය නිවැරදි ව භාවිත කරන අයුරු පැහැදිලි කිරීමට
- අට්ඨකථා කෙරෙහි අවධානය යොමු කරමින් ඒවායේ අරුත් විස්තර කිරීමට
- එබඳු සහිත්‍යාන්තර්ගතයන්හි දාර්ශනික අර්ථ සාකච්ඡා කිරීමට
- ප්‍රායෝගික භාවිතවලට අදාළ සාහිත්‍යාගත ආචාරවිද්‍යාත්මක අගයන් පැහැදිලි කිරීමට
- විධිමත්ව ආගමික වතාවත් ඉටු කිරීමට සහ සදාචාරවත් බව හා ආධ්‍යාත්මික සැනසුම කැමති පිරිස් සඳහා මග පෙන්වීමට හැකියාව ලැබේ.

**පාඨමාලා අන්තර්ගතය :-**

පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන්හි ආරම්භය හා විකාශය, පාලි ව්‍යාකරණයේ ප්‍රභේද; අක්ෂර මාලාව, නාම වරනැගීම, ක්‍රියා වරනැගීම, විභක්ති, අව්‍යය, සන්ධි, සමාස, තද්ධිත සහ කිතක, විනය ග්‍රන්ථයන්හි ඇති භික්ෂූන්ගේ විනයකර්මවලට අදාළ පාලි තේරුම් ගැනීම, පාලි පිරිත් (පරිත්ත) සජ්ඣායනාවල නිරවද්‍යතාව, බෞද්ධ එදිනෙදා ජීවිතයේ දී සිදු කරනු ලබන බණභාවනා ආදියේ දී භාවිත කරනු ලබන පාලි පාඨ සහ ගාථා අධ්‍යයනය, බෞද්ධ සමාජීය ආගමික කටයුතුවල දී (බුද්ධ-පූජා බොධි-පූජා ආදි) පාලි නිවැරදිව යොදා ගැනීම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. Gunaratana, H. (1999): **Bhāvanā Vandanā- Devotions for Meditation,** Bhâvanâ Society, USA.
2. Gunaratana, H. (2013): **Buddha Vandanā** – Book of Devotion, e-library/ Pali studies, http:// www.buddhistelibrary.org/en/displayimage.php?pid=1959
3. Silva, Lily De (2008): **Pali Primer,** VRI, Igatpuri, India.
4. කච්චායන ව්‍යාකරණය, (1995)ඃ වැගම පියරතන හිමි (සංස්.), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
5. ඥානාරාම හිමි, මාතර (1983)ඃ සමථ විදර්ශනා භාවනා මාර්ගය, පුනර්මුද්‍රණය (1994), තායිපේ, තායිවානය, කොළඹ 10.
6. ධම්මානන්‍ද හිමි, මකුරුප්පේ (2010). විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය, ප්‍රථමභාගය, කොලිටි ප්‍රින්ටර්ස්, නුගේගොඩ.
7. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1963), පාලි භාෂාවතරණය, (1, 2, 3 කාණ්ඩ), වෙස්ලි මුද්‍රණාලය, වැල්ලවත්ත.

# දෙවන වසර

# PALI 28214
# PALI 28224

**පාඨමාලා කේතය** :- **PALI 28214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- පාලි සාහිත්‍ය ඉතිහාසය සහ සාහිත්‍යවිචාරය

**ඉගෙනුම් පල** :-

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමේ දී විද්‍යාර්ථියා හට,

01. කොටස

- පාලි සාහිත්‍යයේ ප්‍රභවය සහ සංවර්ධනය පිළිබඳ හැඳින්වීමට
- පාලි ත්‍රිපිටකයේ විවිධ වර්ගීකරණයන් පෙන්වා දීමට
- පාලි සාහිත්‍යයේ සංරක්ෂණය හා සංවර්ධනය උදෙසා බෞද්ධ ධර්ම සංගායනාවල හා සංගීතිකාරක තෙරවරුන්ගේ දායකත්වය විස්තර කිරීමට
- පශ්චාත් පේටක පාලි සාහිත්‍යයේ වැදගත් අංග දැක්වීමට
- පාලි සාහිත්‍යයේ ඓතිහාසික සහ භූගෝලීය ව්‍යාප්තිය පැහැදිලි කිරීමට
- පාලි සාහිත්‍යයේ සංවර්ධනය උදෙසා ශ්‍රී ලාංකේය දායකත්වය සාකච්ඡා කිරීමට

02. කොටස

- පෙරදිග සහ අපරදිග සාහිත්‍ය විචාර මූලධර්ම පැහැදිලි කිරීමට
- භාෂාව, සෞන්දර්යය සහ කලාව පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ ආකල්පය අනාවරණය කිරීමට
- පාලි ග්‍රන්ථ හා සූත්‍ර දේශනාවල ඇති සාහිත්‍යමය වැදගත්කම දැක්වීමට
- බෞද්ධ සාහිත්‍ය විචාරයේ මූලික ක්‍රමවේද පෙන්වා දීමට
- තෝරාගත් පාලි උද්ධරණයන්හි සාහිත්‍යමය ලක්ෂණ ඇගයීමට සහ බුදුදහම පිළිබඳ නූතන විචාරයන්ට පිළිතුරු සැපයීමට හැකියාව ලැබේ.

**පාඨමාලා අන්තර්ගතය :-**

01. කොටස

ත්‍රිපිටකාගත බුදුරජාණන් වහන්සේගේ සහ ශ්‍රාවකයන්ගේ ඉගැන්වීම්, ත්‍රිපිටක සාහිත්‍යය සම්බන්ධයෙන් වන වර්ගීකරණ, බෞද්ධ ඉගැන්වීම් සංරක්ෂණය හා සංවර්ධනය උදෙසා බෞද්ධ ධර්මසංගායනාවල හා සංගීතිකාරක තෙරවරුන්ගේ දායකත්වය, පශ්චාත් පේටක ප්‍රාග් අට්ඨකථා යුගයට අයත් පාලි සාහිත්‍යය, පාලි අට්ඨකථා සාහිත්‍යය, පාලි ප්‍රකරණ ග්‍රන්ථ, පාලි සාහිත්‍යයේ ඓතිහාසික සහ භූගෝලීය ව්‍යාප්තිය, අර්ථ විවරණ ක්‍රමවේද, පාලි සාහිත්‍යයේ සංවර්ධනය උදෙසා ශ්‍රී ලාංකේය දායකත්වය.

02. කොටස

පෙරදිග සහ අපරදිග සාහිත්‍ය විචාර මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය විචාරයේ මූලික ක්‍රමවේද, භාෂාව, සෞන්දර්යය සහ කලාව පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ ආකල්පය, සූත්‍රපිටකයේ තෝරාගත් කාව්‍ය උක්ති, අට්ඨකථා සහ සංග්‍රහ ග්‍රන්ථයන්හි සාහිත්‍යමය අගය; ඒවායෙහි අන්තර්ගත විරිත්, ඡන්දස්, උදාන වාක්‍ය හා ස්වභාවාලංකාර ආදිය, සක්කපඤ්හසුත්ත, කේවඩ්ඪසුත්ත හා පොට්ඨපාදසුත්ත (දී.නි) ධම්මපදපාළි, උදානපාළි, සුත්තනිපාතපාළි හා ජාතකපාළි (ඛු.නි) වුත්තෝදය සහ සුබෝධාලංකාරය ආශ්‍රයෙන් සෞන්දර්යය පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්** :-

1. Hazra, Kanai Lal (1998): **Pali Language and Literature,** Vol. I, II, D. K. Print world, Delhi.
2. Dhirasekara, Jotiya (0000); **Buddhism and Beauty,** Buddhist Publication Socity, Kandy.
3. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2002)ඃ පාලි සාහිත්‍යය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
4. මලලසේකර, ගුණපාල (1965)ඃ ලංකා පාලි සාහිත්‍යය, ගුණසේන සහ සමාගම, කොළඹ.
5. පියරතන හිමි, වෑගම (2006)ඃ සෞන්දර්යය පිළිබඳ බෞද්ධ ආකල්පය, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය.
6. වුත්තෝදය, (1946)ඃ ලබුගම ලඞ්කානන්ද නාහිමි (සංස්.), විද්‍යාශෙඛර, හොරණ.
7. සුබෝධාලඞ්කාරය, (1937)ඃ ලබුගම ලඞ්කානන්ද නාහිමි (සංස්.), විද්‍යාශේඛර, හොරණ.

**පාඨමාලා කේතය** :- **PALI 28224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- පාලි අධ්‍යයනය සඳහා ඉංග්‍රීසි හා පරිවර්තනය

**ඉගෙනුම් ඵල** :-

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමේ දී විද්‍යාර්ථියා හට,

- ඉංග්‍රීසියෙන් ලිඛිත පාලි වචන, වාක්‍ය හා ඡේද කියවා තේරුම් ගැනීමට

- පාලි වාක්‍ය ඉංග්‍රීසියටත් ඉංග්‍රීසි වාක්‍ය පාලියටත් පරිවර්තනය කිරීමට
- පාලි අධ්‍යයන සඳහා අදාළ ඉංග්‍රීසි පාරිභාෂික පද භාවිත කිරීමට
- පාලි සම්භාව්‍ය ග්‍රන්ථවල ඉංග්‍රීසි පරිවර්තන කියවා ඇගයීමට
- පාලි ව්‍යාකරණයේ මූලික අංග ඉංග්‍රීසියෙන් පැහැදිලි කිරීමට
- පාලි ලේඛන ඇසුරු කරමින් ඉගෙන ගැනීමේ දී හා කටයුතු සිදු කිරීමේ දී විද්‍යුද් මූලාශ්‍රය උපයෝගී කරගැනීමට
- ඉංග්‍රීසි භාෂාවෙන් මූලික බෞද්ධ සංකල්පය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කිරීමට
- සම්භාව්‍ය කෘතිවලට අදාළ ව පරිවර්තන ක්‍රමවේද පැහැදිලි කිරීමට
- පාලි ගද්‍ය හා පද්‍ය කොටස් ඉංග්‍රීසියට/සිංහලයට පරිවර්තනය කිරීමට හැකියාව ලැබේ.

**පාඨමාලා අන්තර්ගතය :-**

පාලි ව්‍යාකරණයේ මූලික අංග ඉගෙනීම (New Pali Course I සහ II ග්‍රන්ථ කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින්) පාලි සම්භාව්‍ය කෘතිවල තෝරාගත් ඡේද, පාලි පාරිභාෂිකපද, පාලි ව්‍යාකරණමය පදමාලාව, පාලි ශබ්දකෝෂ, පාලි සහ බෞද්ධ මූලාශ්‍රයවල ඉංග්‍රීසි පරිවර්තන පිළිබඳ අවබෝධය, පාලි ඉගෙනීම සඳහා විද්‍යුද් මූලාශ්‍රය, සම්භාව්‍ය කෘතිවලට අදාළ ව පරිවර්තන ක්‍රමවේද, සාම්ප්‍රදායික පාලි රීතිය හා ව්‍යාකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පාලි ගද්‍ය හා පද්‍ය කොටස් ඉංග්‍රීසියට/සිංහලයට පරිවර්තනය කිරීම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. Anuruddha Thera, Kakkapalliye (2010): **A Guide to the Study of Pali,** The Hong Kong University.
2. Buddhadatta, A. P. **Aids to Pali Conversation and Translation,** Ambalangoda.
3. Buddhadatta, A. P. (2014): **New Pali Course I & II,** The Buddhist Cultural Centre, Colombo.
4. Lay, U Ko (1984): **Guide to Tipitaka,** Buddhist Cultural Centre, Colombo.
5. Warder, A. K. (1963): **Introduction to Pali,** The Pali Text Society, London.
6. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1962)ඃ පාලි ගද්‍යපද්‍ය රචනා, අනුල මුද්‍රණාලය, කොළඹ.
7. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (1947)ඃ පාලි වාක්‍යරචනාව හා පරිවර්තනය, සාහිත්‍ය මුද්‍රණාලය, කොටහේන.

# තෙවන වසර

# PALI 38214
# PALI 38224

**පාඨමාලා කේතය** :- **PALI 38214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- ථෙරවාද විනය සහ අභිධර්ම අධ්‍යයනය

**ඉගෙනුම් ඵල** :-

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමේ දී විද්‍යාර්ථීන් හට,

01. කොටස

- ථෙරවාද විනය සාහිත්‍යයෙහි ප්‍රභවය සහ විකාශය හැඳින්වීමට
- ථෙරවාද විනය කෙරෙහි බෞද්ධධර්ම සංගායනාවල ඇති අදාළත්වය අනාවරණය කිරීමට
- ථෙරවාද විනය සාහිත්‍යයෙහි දක්නට ලැබෙන විනය නීති විග්‍රහ කිරීමට
- බෞද්ධ සංඝසමාජය (ශාසනය) කෙරෙහි විනයෙහි බලපෑම දැක්වීමට
- විනය නීති පැනවීමේ ආචාර විද්‍යාත්මක සහ සමාජීය වැදගත්කම විස්තර කිරීමට
- වත්මන් විනයකර්ම පිළිබඳ පැහැදිලි කිරීමට

02. කොටස

- මුල් බුදුසමය තුළ විද්‍යමාන අභිධර්මයේ මූලය හඳුනා ගැනීමට
- ථෙරවාද අභිධර්ම සාහිත්‍යයෙහි සංවර්ධනය සනිදර්ශන ව දැක්වීමට
- ථෙරවාද අභිධර්මයෙහි මූලික ඉගැන්වීම් අනාවරණය කිරීමට
- බෞද්ධදර්ශනයෙහි මූලධර්ම සහ අභිධර්මය අතර ඇති අන්තර් සම්බන්ධතාව හෙළිදරව් කිරීමට
- ආභිධර්මික ඉගැන්වීම් සම්බන්ධයෙන් වන අට්ඨකථාගත අර්ථ විවරණ විස්තර කොට දැක්වීමට
- අභිධර්මය කෙරෙහි වන විවිධ අන්තර්නිකායික ප්‍රවණතාවල විෂමතා දැක්වීමට සහ
- ආභිධර්මික නාම-රූප විග්‍රහයෙහි ප්‍රායෝගික අගය පරීක්ෂා කිරීමට හැකියාව ලැබේ.

**පාඨමාලා අන්තර්ගතය :-**

01. කොටස

ථෙරවාද විනයෙහි ප්‍රභවය හා විකාශය, ත්‍රිපිටකාගත සහ පශ්චාත් පේටක විනය සාහිත්‍යය, සීලය සහ විනය, ත්‍රිපිටකාගත සහ පශ්චාත් පේටක විනය සාහිත්‍යය කෙරෙහි අවධානය යොමු කරමින් පාරාජිකා, සංඝාදිසෙස, අනියත, නිස්සග්ගිය, පාචිත්තිය, අධිකරණසමථ සහ සෙඛියා වැනි විනය නීති විග්‍රහ කිරීම, බෞද්ධ සංඝසමාජය (ශාසනය) කෙරෙහි විනයෙහි බලපෑම, ඛන්ධක විනයෙහි ඇති ආචාර විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක අගය, නූතන ආගමික සන්දර්භයෙහි විනය.

02. කොටස

මුල් බුදුසමය තුළ විද්‍යමාන අභිධර්මයෙහි මූලය, ථෙරවාද අභිධර්ම සාහිත්‍යයෙහි සංවර්ධනය, ථෙරවාද අභිධර්ම සාහිත්‍යයෙහි විස්තර කොට ඇති ආකාරයට චිත්ත, චෛතසික, රූප, නිබ්බාන, චිත්තවීථි, භවංග, පච්චයාකාරණය, පඤ්ඤත්ති, පරමත්ථ සහ භාවනා වැනි අභිධර්මයෙහි එන මූලධර්ම, බෞද්ධදර්ශනයෙහි මූලධර්ම සහ අභිධර්මය අතර ඇති අන්තර් සම්බන්ධතාව, ආභිධර්මික ඉගැන්වීම් සම්බන්ධයෙන් වන අන්තර් නිකායික විවිධ ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුමක්, ආභිධර්මික නාම-රූප විග්‍රහයෙහි ප්‍රායෝගික අගය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**

1. Hinüber, Oskar Von (1995): **Buddhist Law According to the Theravāda-Vinaya: A survey of Theory and Practice,** Journal of the International Association of Buddhist Studies, Vol. 18.

2. Sumanapala, G. D. (1988): **Theravada Abhidharma,** Buddhist Research Society, Singapore.
3. අබේනායක, ඔලිවර් (1983)ඃ ත්‍රිපිටක සාහිත්‍ය ඉතිහාසය 1, 'විනය පිටකය', ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.
4. අභිධර්ම අධ්‍යයන, (1995)ඃ තිලකරත්න, අසංග (සංස්.), කරුණාරත්න සහ පුත්‍රයෝ, කොළඹ.
5. චන්‍දවිමල හිමි, රේරුකානේ (1987)ඃ අභිධර්මමාර්ගය, ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.
6. ශ්‍රී ධර්මවංශ හිමි, මාතර (1982)ඃ අභිධර්මචන්‍ද්‍රිකාව, කොළඹ තරුණ බෞද්ධ සංගමය.
7. රාහුල හිමි, කොටපිටියේ (2006)ඃ බෞද්ධ විනය අධ්‍යයන, ශ්‍රී ලංකා පාලි ග්‍රන්ථ සමිතිය.

**පාඨමාලා කේතය** :- **PALI 38224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- **විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය, රචනය**

**ඉගෙනුම් පල** :-

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමේ දී විද්‍යාර්ථියා හට,

- පාලි ව්‍යාකරණය අධ්‍යයනය සඳහා වන විවිධ ප්‍රවේශයන් හැඳින්වීමට
- සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණයෙහි ඇති මූලික අංග තුලනය කරමින් ඒවායේ වෙනස්කම් දැක්වීමට
- සාම්ප්‍රදායික ව්‍යාකරණඥයන්ගේ පද විද්‍යාත්මක සහ ශබ්ද විද්‍යාත්මක පර්යේෂණයන් පිළිබඳ සාකච්ඡා කිරීමට

- පාලි ව්‍යාකරණය සම්බන්ධයෙන් වන නූතන අධ්‍යයනයන් සහ ප්‍රවණතාවන් අධ්‍යයනය කිරීමට
- පාලි රූඪී භාවිතය පිළිබඳ පරීක්ෂා කිරීමට සහ ඒවා භාවිත කිරීමට
- සංස්කෘත සහ සිංහල සමග පාලියෙහි ඇති සම්බන්ධතාව දැක්වීමට
- පාලි ප්‍රස්තාව පිරුළුවල ඇති ගූඪාර්ථ පැහැදිලි කිරීමට
- පාලි ඡේදවල ඇති ව්‍යාකරණ විග්‍රහ කිරීමට
- පාලි රචනාවල ඇති සාහිත්‍ය ශෛලීය පරීක්ෂා කිරීමට
- දී ඇති පාලි ඡේදවල අන්තර්ගතය පිළිබඳ අර්ථකථනය කිරීමට සහ පාලියෙන් වාක්‍ය, ඡේද සහ රචනා ලිවීමට හැකියාව ලැබේ.

**පාඨමාලා අන්තර්ගතය :-**

පාලි ව්‍යාකරණය අධ්‍යයනය සඳහා වන විවිධ ප්‍රවේශයන්, අක්ෂරමාලාව, (සඤ්ඤා) සන්ධි, සමාස, තද්ධිත, කිතක, ආඛ්‍යාත, නිපාත, උපසර්ග සහ කාරක වැනි සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණයෙහි ඇති මූලික අංග පිළිබඳ ඓතිහාසික සහ විමර්ශනාත්මක නයින් අධ්‍යයනය කිරීම, සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණයේ එන පද විචාරාත්මක සහ ශබ්ද විචාරාත්මක විග්‍රහයන්, පාලි රූඪී සහ ප්‍රස්තාව පිරුළු, පාරිභාෂිකපද, පාලි ව්‍යාකරණය පිළිබඳ නූතන අධ්‍යයනයන් සහ මෑතකාලීන විවිධ ප්‍රවණතා, සංස්කෘත සහ සිංහල සමග පාලියෙහි ඇති සම්බන්ධතාව, පාලියෙන් වාක්‍ය, ඡේද සහ රචනා ලිවීම.

**ඇගයීමේ ක්‍රමය** :-

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්** :-


1. Anuruddha Thera, Kakkapalliye (2010): **A Guide to the Study of Pali,** The Hong Kong University.
2. Norman, K. R. (1997): **A Philological Approach to Buddhism,** SOAS University of London.
3. Gnanaratana thero, Nabirittankadawara (2020): **MĀGAĪ AND ARDHA-MĀGADĪ PRĀKRIT- A SOCIO-LINGUISTIC STUDY**, Vidyalankara press, Peliyagoda.
4. ධම්මානන්ද හිමි, මකුරුප්පේ (2016)ඃ විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය, ප්‍රථම හා ද්විතීය භාගය, කොලිටි ප්‍රින්ටර්ස්, නුගේගොඩ.
5. ගයිගර්, විල්හෙල්ම් (1989)ඃ පාලි ව්‍යාකරණය, අනුවාදක චන්ද්‍රා වික්‍රමගමගේ, ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය, පන්නිපිටිය.